

ඩබ්ලියු. ඒ. සිල්වා: පුවත්පත් සඟරා සංස්කරණය







ආචාර්ය සඳගෝමි කෝපරහේවා

සිංහල අංශය

කොළඹ විශ්වවිද්‍යාලය

ඩබ්ලියු. ඒ. සිල්වා : පුවත්පත් සඟරා සංස්කරණය

සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය විමසන විට කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ, නූතන සිංහල භාෂා සාහිත්‍යයේ සංවර්ධනයට දායක වූ සාහිත්‍යධරයන් බොහෝ දෙනෙකු පුවත්පත් සඟරා සංස්කරණය කරමින් සිදු කර ඇති ශාස්ත්‍රීය සේවාව යි. බෙම්තොට ඇල්බට් ද සිල්වා, පියදාස සිරිසේන, ඇම්.සී.එෆ්. පෙරේරා, කුමාරතුංග මුනිදාස, මාර්ටින් වික්‍රමසිංහ, හේමපාල මුනිදාස ආදීහු ඒ අතර කැපී පෙනෙති. මුද්‍රිත මාධ්‍යයක් වශයෙන් පුවත්පත් සඟරා ප්‍රචාරයට පත් කරමින් පාඨක සමාජයක් බිහි කිරීමට මූලික වූ මේ පත්‍ර කර්තෘවරු, තත්කාලීන සමාජ, දේශපාලනික හා සංස්කෘතික ක්ෂේත්‍රයේ ද කැපී පෙනෙන සේවාවක් ඉටු කළහ.

විසිවන සියවසේ සිදු වූ නූතන සිංහල සාහිත්‍යයේ වර්ධනයත්, පුවත් සඟරා සංස්කරණයත් අතර ඇති අත්‍යන්ත සම්බන්ධය විමසීමේ දී වැදගත් වන ලේඛකයන් අතර **ඩබ්ලියු.ඒ. සිල්වා** (1890-1957) සුවිශේෂී ස්ථානයක් හිමි කර ගනියි. නූතන සිංහල සාහිත්‍යයේ දියුණුවට පුරෝගාමී වූ සාහිත්‍යධරයකු ලෙස කීර්තියක් හිමි කරගෙන සිටින ඩබ්ලියු. ඒ. සිල්වා, සිංහල පුවත්පත් සඟරා සංස්කරණය මගින් ද ස්වකීය සාහිත්‍ය මෙහෙවර ව්‍යාප්ත කළේය. විසිවන සියවසේ දෙවන හා තෙවන දශකවල සිංහල නිර්මාණ සාහිත්‍යය හා පුවත්පත් සඟරා සංස්කරණය අතර පැවැති සමීප සම්බන්ධය ඩබ්ලියු. ඒ. සිල්වාගේ සාහිත්‍ය කලා ජීවිතය ඇසුරින් ද හඳුනාගත හැකිය. සිංහල නවකථා, කෙටිකතා, පරිවර්තන ආදියෙන් මෙන්ම, පුවත්පත් සඟරා මාර්ගයෙන් ද සිංහල පාඨක සමාජය වෙනුවෙන් ඉටු කළ හැකි කාර්යභාරය මනාව අවබෝධ කරගෙන සිටි කෘතහස්ත ලේඛකයකු වූ ඩබ්ලියු. ඒ. සිල්වා, දශක තුනක පමණ කාලයක් (1919-1948) පත්‍ර සඟරා සංස්කරණයේ යෙදී ඇත.

කොළඹ වැල්ලවත්ත ප්‍රදේශයේ 'සිල්වර්මියර්' නිවස කේන්ද්‍ර කර ගනිමින් ජීවත් වූ ඩබ්ලියු. ඒ. සිල්වා, 1906 දී කොළඹ වෙළඳ සමාගමක ලිපිකරුවකු ලෙෂ තම වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. 1909 දී 'සිරියලතා' නවකථාව පළ කරමින්, ළාබාල වියේදී ම නවකථාකරුවකු ලෙස සිංහල පාඨකයන් අතර ජනප්‍රියත්වයක් හිමි කර ගත් මොහු, බම්බලපිටියේ වජිරාරාමාධිපති පැළෑනේ සිරි වජිරඤාණ නාහිමි සහ 'ලක්මිණි පහන'

කර්තෘ මාතර ධර්මරත්න යන පඬිවරුන් වෙතින් සිංහල, පාලි හා සංස්කෘත යන භාෂා පිළිබඳ හසළ දැනුමක් ලබාගෙන නිර්මාණකරණයට පිවිසියේය. සමකාලීන ගිහි-පැවිදි විද්වතුන් රාශියක් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වූ ඩබ්ලියු. ඒ. සිල්වාගේ භාෂා සාහිත්‍ය මෙහෙවර නවකථාකරණය, කෙටිකතාකරණය හා පුවත්පත් සඟරාකරණය යන අංශ ත්‍රිත්වය යටතේ අධ්‍යයනය කළ හැකිය. ඩබ්ලියු. ඒ. සිල්වාගේ නිර්මාණ සහ සන්නිවේදනය පිළිබඳව මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර කිසියම් අවධානයක් යොමු කර ඇති නමුදු, ඩබ්ලියු. ඒ. සිල්වාගේ පත්‍ර සඟරා සංස්කරණ භූමිකාව පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය අධ්‍යයනයක් තවමත් සිදු වී නොමැත.

ඩබ්ලියු.ඒ. සිල්වාගේ පත්‍ර සඟරා සංස්කරණ මෙහෙවර ප්‍රධාන අංශ හතරක් ඔස්සේ සලකා බැලිය හැකිය.

(1) 'සිරිසර සඟරා' සංස්කරණය (1919-1921)
(2) 'ලංකා සමය' පුවත්පත සංස්කරණය (1933-36)
(3) 'නුවණ' සඟරාව සංස්කරණය (1940-1947)
(4) 'තිලක' සඟරාව සංස්කරණය (1948)

සිංහල නවකථාව ඉතාම ජනප්‍රිය සාහිත්‍යාංගයක් බවට පත් කිරීමට 1920-30 දශකවල දී කැපී පෙනෙන දායකත්වයක් සැපයූ ඩබ්ලියු.ඒ. සිල්වා, පත්‍ර සඟරා සංස්කරණය මාර්ගයෙන් ද නිර්මාණ සාහිත්‍යයේ දියුණුවට කටයුතු කළ ලේඛකයෙකි. ස්වකීය නිර්මාණ පොත් වශයෙන් පළ වීමට පෙර, පත්‍ර සඟරා මාර්ගයෙන් ප්‍රචාරයට පත් කිරීමට සමකාලීන සාහිත්‍යධරයන් ගත් මඟ යමින් ඩබ්ලියු. ඒ. සිල්වා ද තම නිර්මාණ ගණනාවක් කොටස් වශයෙන් පත්‍ර සඟරාවල පළ කෙළේය. එමෙන්ම, කාලීන සාහිත්‍ය ප්‍රශ්න හා මතවාද විෂය කර ගනිමින් පුවත්පත් සඟරාවලට ලිපි සම්පාදනය කිරීමට ද ඩබ්ලියු.ඒ. සිල්වා ඉදිරිපත් වී ඇත. 1930 මාර්තු-මැයි කාලය තුළ සී. ඩබ්ලිව්. වික්‍රමාරච්චිගේ කර්තෘත්වයෙන් පැවැති 'ස්වදේශ මිත්‍රයා' පුවත්පතේ 'නවකථාකරණය' පිළිබඳව ඩබ්ලියු. ඒ. සිල්වා සහ මාර්ටින් වික්‍රමසිංහ අතර පැවැති වාදය ඊට එක් නිදසුනකි. ඩබ්ලියු. ඒ. සිල්වාගේ සංස්කරණය යටතේ පැවැති පත්‍ර සඟරා විමසීමෙන් ද ඔහුගේ සාහිත්‍ය මෙහෙවර සහ පත්‍ර සඟරා අතර පැවැති අත්‍යන්ත සම්බන්ධය මෙන්ම, සමකාලීන සමාජ-සංස්කෘතික පසුබිම පිළිබඳ වැදගත් තොරතුරු රැසක් ද අනාවරණය කර ගත හැකිය.

(1) 'සිරිසර සඟරා' සංස්කාරක (1919-1921)

ඩබ්ලියු. ඒ. සිල්වාගේ සංස්කරණයෙන් පළ වූ මුල්ම සඟරාව වූයේ 1919 පෙබරවාරි මාසයේ දී ආරම්භ වූ 'සිරිසර' සඟරාවයි. ''ශ්‍රී සාරය හකුළුවා තැන්පත් කරනු ලබන්නේ මෙහිය යන අර්ථයෙන් 'සිරිසර සඟරා' යැයි නම් කළෙමු'' යනුවෙන් ආරම්භක කලාපයේ

සඳහන් වේ. මුද්‍රිත මාධ්‍යයක් වශයෙන් සඟරාවකින් ඉටු කළ හැකි මෙහෙවර පිළිබඳව ඩබ්ලියු.ඒ. සිල්වා තුළ පැවැති අදහස 'සිරිසර සඟරා' පළමු කලාපයේ කතුවැකියෙන් හෙළි වේ.

> සිංහල සඟරාවක් නොමැති පාඩුව සඟරාවකින් මුත් ප්‍රවෘත්ති පත්‍රවලින් පිරිමැසිය නොහැක. ප්‍රවෘත්ති පත්‍රවලින් ස්වදේශීය විදේශීය ප්‍රවෘත්ති හා දේශපාලන ක්‍රම පිළිබඳ මහජනයාගේ මතභේදත් දැනගත හැක. එහෙත් සඟරාවකින් එසේ නොව, නා නා කරුණු පිළිබඳ ශාස්ත්‍රීය ලිපිත්, ක්‍රමික විද්‍යාන්විත හස්තසාර පරීක්ෂණයන් හා ඓතිහාසික දුලීභ පයේෂණයන් පිළිබඳ ලියවිලිත්, ජීවන චරිත හා පුරාණ වස්තු විද්‍යානුගත ලියවිලිත්, අභිනව ප්‍රබන්ධ හා නා නා සමයානුගත දෘෂ්ටි ප්‍රභේද ප්‍රකාශක ලිපිත්, හාස්‍යෝත්පාදක ලියවිලි ආදී මහත් පරිශ්‍රමයෙන් පිළියෙල කරනු ලබන ශිෂ්ටාචාර සංවර්ධනයට හා ඥානාභිවර්ධනයටත්, තුෂ්ටි ප්‍රශාද වර්ධනයටත්, ඉවහල් වූ නොයෙක් දේ පළවෙන බැවින් බොහෝ ප්‍රයොජන ලැබේ. එබැවින් සිංහල සඟරාවක් නැති පාඩුව පිරිමසාලන අටියෙන් ''සිරිසර සඟරා'' නම් වූ මේ අභිනව සඟරාව අප විසින් ආරම්භ කරන ලද්දේය.

'සිරිසර' සඟරාව ආරම්භ වූයේ දෙවන ලෝක මහා යුද්ධය අවසාන වූ සමයේදීය. එම යුද්ධය නිසා ඇති වූ විවිධ ආර්ථික බාධක හේතුවෙන් අඩපණ වූ ප්‍රවෘත්ති පත්‍ර සඟරා වෙනුවට අභිනවයෙන් සිංහල සඟරාවක් පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව එකල තරුණ වියේ සිටි ඩබ්ලියු.ඒ. සිල්වා අවබෝධ කරගෙන සිටියේය. මසකට දෙවරක් බැගින් නොකඩවා පළ වූ මේ සඟරාව ඉතා කෙටි කලකින් ජනප්‍රිය වූ අතර, එහි දායක සංඛ්‍යාවට ඇතුළත් වූ පාඨකයන්ගේ ගණන දෙදහස ද ඉක්මවා ඇත. එකල මාර්ටින් වික්‍රමසිංහ මහතා ද 'සිරිසර' සඟරාවේ දායකයකු වී සිටි අතර, ඔහුගේ 'ශාස්ත්‍රීය ලේඛන' නම් කෘතිය පිළිබඳ විවේචනයක් ද එම සඟරාවේ පළ වූ බව සඳහන් වේ. 'සිරිසර' සඟරාවට ලිපි ලබා ගැනීමේ දී සමකාලීන ගිහි-පැවිදි උගතුන්ට ඇරයුම් කිරීමේ පිළිවෙතක් අනුගමනය කළ ඩබ්ලියු.ඒ. සිල්වා, තම දෙවන නවකථාව වූ 'ලක්ෂ්මී' කොටස් වශයෙන් ද 'සිරිසර' සඟරාවේ පළ කළේය. 1919 සිට 1921 දක්වා පුරා වසර දෙකක් අඛණ්ඩව පළ වූ මේ සඟරාවේ සමකාලීන ගිහි-පැවිදි ලේඛකයන් රැසකගේ ලිපි-නිර්මාණ පළ වී ඇත. 1919 නත්තල් උත්සවය වෙනුවෙන් විශේෂ නත්තල් කලාපයක් පවා පළ කර තිබීමෙන් පෙනී යන්නේ ආගම් භේදයකින් තොරව අපක්ෂපාතව සඟරාව සංස්කරණය සඳහා ඩබ්ලියු. ඒ. සිල්වා දැරූ ප්‍රයත්නය යි. 'පුවත්පත් සඟරාවලට ලියවිලි පිළියෙල කිරීම' නමින් 'සිරිසර' සඟරාවට සංස්කාරක විසින් සපයන ලද ලිපි පෙළින් ද පැහැදිලි වන්නේ මුද්‍රිත මාධ්‍යයට සුදුසු පරිදි සිංහල ලේඛන කලාව දියුණු කර ගැනීමට ඩබ්ලියු. ඒ. සිල්වා තුළ පැවති අභිප්‍රාය යි.

(2) 'ලංකා සමය' කර්තෘ (1933-1936)

1930 දශකය වන විට මෙරට සිටි ජනප්‍රියතම සිංහල නවකථාකරුවා වූයේ ඩබ්ලියු. ඒ. සිල්වා මහතා ය. එම අවදිය වන විට 'සිරියලතා' (1909), 'ලක්ෂ්මී' (1922), 'හිඟනකොල්ලා' (1923), 'පාසල් ගුරුවරී' (1924), 'කැලෑ හඳ' (1933) යන නවකථා ලියා පළ කරමින් ජනප්‍රියත්වයක් හිමි කරගෙන සිටි ඔහු සමකාලීන සාහිත්‍යධරයන්, පඬිවරුන් සහ පත්‍ර කර්තෘවරුන් සමඟ ද සමීප සම්බන්ධතා පවත්වාගෙන ගිය ලේඛකයෙකි. 1933 අප්‍රේල් මස 01 වනදා ඩබ්ලිව්. ඊ. බැස්ටියන් සහ සමාගම මඟින් ආරම්භ කරන ලද 'ලංකා සමය' සතිපතා පුවත්පතේ සංස්කාරක ධුරයට පත් කර ගනු ලැබුවේ ඩබ්ලියු. ඒ. සිල්වා ය. 'ලංකා සමය' මුලින් ම පිටු 12 කින් ද පසුව පිටු 16 කින් ද යුක්තව ශනි දින පළ වූ ඩ්‍රෝඩ්ෂීට් ප්‍රමාණයේ පුවත්පතකි. 'ලංකා සමය' පත්‍රයේ මුල්ම කතු වැකියේ මෙසේ සඳහන් වේ.

> ලංකා මහජන ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් ලංකා සමය නමින් ශනි දිනයන්හි නිකුත් කරනු ලබන මේ ප්‍රවෘත්ති පත්‍රයෙන් දේශපාලනය අතින් මහජනයා සතු අයිතිවාසිකම් රැක ගැනීමත්, ඉගෙනීම අතින් රටේ විද්‍යා ලෝකයක් පැතිරවීමත් ගොවිකම්, අත්කම් හා වෙළෙඳාම් අතින් අළුත් උද්‍යෝගයක් ඇති කිරීමත්, නවීන ජන සමාජයට අවශ්‍ය මනුෂ්‍ය ධර්මයන් හා චාරිත්‍ර විශේෂයෙන් හඳුන්වා දෙමින් කුලයට හෝ බලයට හෝ නෑකමට හෝ වසඟ නොවී, සීමාන්තයෙහි ද නොපිහිටා පොදු යහපත සලකා වැඩ කරන සැටි පෙන්වාදීමත් අදහස් කරනු ලැබේ. අපගේ මේ 'ලංකා සමය' පොදු මහජනයාගේ පොදු දියුණුව සලකා පොදු වැඩට උදව් දෙන්නකි. සෘජු ප්‍රතිපත්තියෙහි හැසිරෙන බැවින් අපට සතුරු වශයෙන් හෝ මිතුරු වශයෙන් ගැණෙන කිසිවෙකුත් නොවන්නාහ.

ඩබ්ලියු. ඒ. සිල්වා සංස්කාරකත්වය යටතේ 1933 සිට 1936 දක්වා වසර තුනක් පළ වූ 'ලංකා සමය' පුවත්පත දේශීය-විදේශීය ප්‍රවෘත්ති, ශාස්ත්‍රීය ලිපි හා කථා, කාව්‍ය තීරය, මූලික විද්‍යා ලිපි පෙළ, පොත්පත් විවේචන, කාලීන මාතෘකා අනුව ලියැවුණු කතුවැකි, ඡායාරූප, දැන්වීම් ආදියෙන් යුක්ත විය. 1930 දශකය තුළ රටේ පැන නැගුණු විවිධ සමාජ-ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ප්‍රශ්න අරබයා 'ලංකා සමය' පුවත්පතේ ලිපි, පුවත් හා කතුවැකි මහජනයාට මෙන්ම දේශපාලනඥයන්ට ද ප්‍රයෝජනවත් විය. පහත දැක්වෙන කතුවැකි සිරස්තල කීපය විමසීමෙන් ද එය පැහැදිලි වේ.

සිංහලෙන් රට පාලනය
අපරාධ මර්දනය
සියබසින් වැඩ කළ යුතු කාලය
සිංහලෙන් උසාවි පැවැත්වීම

ජල බලයෙන් විදුලිය ඉපදවීම
සිංහල භාෂාව හා පොලිස් දෙපාර්තමේන්තුව
රටේ භාෂාව නොදත් ආණ්ඩුවේ නිලධාරීන්

'ලංකා සමය' වැඩි කලක් නොපැවතුණ ද නූතන සිංහල සාහිත්‍යයේ දියුණුවට බෙහෙවින් දායක වූ පුවත්පතකි. ඩබ්ලියු. ඒ. සිල්වාගේ 'සුනේත්‍රා නොහොත් අවිචාර සමය' 1936 දී පොතක් වශයෙන් පළ වීමට පෙර 'ලංකා සමය' පුවත්පතේ 1933 සිට කොටස් වශයෙන් පළ වී ඇත. එමෙන්ම, ඩබ්ලියු. ඒ. සිල්වාගේ නවකථා පිළිබඳ දැන්වීම් පවා 'ලංකා සමය' පත්‍රයේ පළ විය. 'ලංකා සමය' කර්තෘ ලෙස ඩබ්ලියු. ඒ. සිල්වා කටයුතු කළ සමයේ දී (1933-36) ඔහුගේ සමකාලීන මිතුරන් වූ කුමාරතුංග මුනිදාස මහතා 'ලක්මිණි පහන' කර්තෘ ලෙසත් (1934-36), මාර්ටින් වික්‍රමසිංහ මහතා 'දිනමිණ' කර්තෘ ලෙසත් කටයුතු කර ඇත.

(3) 'නුවණ' සඟරාවේ සංස්කාරක (1940-1947)

කොළඹ පිටකොටුවේ නොරිස් වීදියේ (දැන් ඕල්කට් මාවත) නුවණ පොත්හලේ කළමනාකරු වශයෙන් ඩබ්ලියු. ඒ. සිල්වා කටයුතු කළ සමයේ දී 'නුවණ' නමින් සඟරාවක් 1940 අගෝස්තු 15 වනදා ආරම්භ කිරීමට ද මූලික විය. 'නුවණ සංස්කාරකගේ' යනුවෙන් මෙහි පළමු කලාපයේ පළ වූ ලිපියකින් නිවැරදි ලිහිල් සිංහලෙන් ලිපි ලිවීමේ වැදගත්කම මෙසේ අවධාරණය කළේය.

> ''නුවණ'' සැමට ම පොදු ය. මහා විශාරදයන් පටන් පාත්‍රයන් දක්වා සියල්ලන්ගේ සිත් ගැනීමට - කල්පනා ශක්තිය ප්‍රකෘතිමත් වීමට - විනෝදයට - චරිත්‍ර පරිශෝධනයට උපකාර වන්නා වූ ලිපි මතු ද මීට වැඩියෙන් පළ වන බවට මේ පළමුවැනි කලාපයම සාක්ෂ්‍යයකි.... ''නුවණේ'' භාෂාව ද ලිහිල් ය. ඇතැම් පුවත්පත්වල මෙන් මෙහි සිංහලයටත් නැති ඉංගිරිසියටත් නැති එහෙත් ඒ දෙකින් ම විහිළු සංස්කරණයකට පැමිණි විකාර නොපෙනෙනු විය හැකියි. ලිපි සපයන්නකුට තමන් කැමති භාෂා රීතියකින් වුනම් තමන්ට ම විශේෂ වූ භාෂා රූපයකින් පෙනී සිටින්නට මෙහි පුළුවන... අපගේ වෑයම, සිංහල භාෂාව සිංහලයට අනුරූප වන පරිද්දෙන් දියුණු කිරීම හෝ සංස්කරණය කිරීම විනා සංකරයක් කිරීම නොවේ. එහෙයින් නුවණට ලිපි සපයනු කැමති භවත්හු ඒ සිතට ගනිත්වා (නුවණ, 1940 අගෝ.).

සාහිත්‍ය කලා නිර්මාණවලට වැඩි අවධානයක් සහිතව සැකසුණු 'නුවණ' සඟරාවේ විදේශීය කෙටිකතාවල සිංහල පරිවර්තන මෙන්ම 'නවකථාකරණය' පිළිබඳ ලිපි පෙළක් ද පළ විය. ජයදේව, ශූරපාද හා ප්‍රියදර්ශි ආදී ආරූඪ නම්වලින් සංස්කාරකයාණන් විසින් ම රචිත ශාස්ත්‍රීය ලිපිවලින් ද 'නුවණ' සඟරාව පෝෂණය විය. 'කොට කතා' නමින් ඩබ්ලියු.ඒ. සිල්වා විසින් හඳුන්වන ලද කෙටිකතා නම් සාහිත්‍යාංගය මෙරට ජනප්‍රිය කිරීමට ද ඒ පිළිබඳ විචාර සාහිත්‍යයක් පළ කිරීමට ද 'නුවණ' සඟරාව යොදා ගැනිණ. එකල පැවැති ප්‍රධාන පෙළේ සඟරාවක් වූ මෙහි තම නවකථාවලට ආචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර එල්ල කළ විවේචනවලට පිළිතුරු සැපයීම ද සිදු විය. විශේෂයෙන් ම සරච්චන්ද්‍රයන්ගේ 'Modern Sinhalese Fiction' (1943) කෘතිය විවේචනය කරමින්, 'මූසිල' යන නාමයෙන් 'නුවණේ' පළ වූ ලිපි පෙළ සමකාලීන සාහිත්‍ය සංවාද විමසන්නකුට වැදගත් වන්නකි. එමෙන්ම, ඩබ්ලියු.ඒ. සිල්වාගේ 'එක්දහස් එක් රැය' කෘතිය ප්‍රථම කාණ්ඩය 'නුවණ' සඟරාවේ කොටස් වශයෙන් පළ වී ඇත. 1940 සිට පුරා වසර හතක් (1947) 'නුවණ' සංස්කාරක වශයෙන් කටයුතු කළ ඩබ්ලියු.ඒ. සිල්වා, 1947 දී 'නුවණ' පොත්හලේ කළමනාකාර ධුරයෙන් ද අස් විය. ඔහුගේ සමීප මිතුරකු වූ කුමාරතුංග මුනිදාස මහතා 'සුබස' සඟරාව (1939-1943) පවත්වාගෙන යනු ලැබුවේ ද මේ කාලයේ දී ය.

(4) 'තිලක' සඟරාවේ සංස්කාරක (1948)

දශක තුනක පමණ කාලයක් පත්‍ර සඟරා සංස්කරණයේ අත්දැකීම් ලබා සිටි ඩබ්ලියු.ඒ. සිල්වා අවසන් වරට සැකසූ සඟරාවට 'තිලක' නමින් 1948 අගෝස්තු මාසයේ දී ස්වස්තික මුද්‍රණාලයේ ප්‍රකාශනයක් ලෙස පළ විය. 'තිලක' සඟරාවේ සහාය සංස්කාරක ලෙස කටයුතු කළේ දීගොඩ පියදාස ය. එහි මංගල කලාපයේ පළ වූ මේ අදහසින් සංස්කාරකත්වයේ අරමුණ පැහැදිලි වේ.

> 'තිලක' විද්‍යාලෝකය ව්‍යාප්ත කිරීම පරමාර්ථ කර ගත්තකි. මෙහි මෙරට දේශපාලනය හා සම්බන්ධ කිසිම පක්ෂයක් හා අපගේ විශේෂ බැඳීමක් නැත්තේය. දේශපාලනය අතින් මෙරට ජනයාගේ දැනුම පිරිසුදු වීමට සුදුසු ලියුම් පළවෙතත්, ඒ පළවෙන්නේ ද පක්ෂ පෝෂණයක් මූලික කරගෙන නොවේ. එහෙත් ඇත්ත ඇති සැටියේ මහජනයාට පෙන්වා දෙන අවංක අදහසින් ය... මේ, සියබසින් රට කෙරෙන්නට යන අවදියකි. එහෙයින් සිංහල කියවන හැමදෙනාගේම හිස, බොහෝ නුවණ තැන්පත් වූ මොළයකින් සමන්විත විය යුතුය... දැන් අපි කවටකම්වලින් ඉතා දිළිඳු වෙමු. ඒ දිළිඳුකම අත්හැරෙන්නට නම් කවට පිරුළු කියන්නටත්, ඒවා තේරුම් ගන්නටත් අප සුදුසු විය යුතුයි (තිලක, 1948 අගෝ.).

යම් යම් බාහිර හේතූන් නිසා වැඩිකල් නොපැවතුණු නමුදු 'තිලක' සඟරාව ද සිංහල පාඨකයන්ට විශේෂාංග එක් කළ සඟරාවක් විය. 'තිලක' සඟරාවේ පළ වූ 'සිනාමුල්ල' නම් විශේෂාංගයේ අරමුණ වූයේ සිංහලයන් ''සිනාසෙන්නට හැකි'' ජාතියක් බවට පත් කර ගැනීම ය. එමෙන්ම, සිංහල භාෂාව හා ලේඛන රීතිය මුද්‍රණයට සුදුසු පරිදි සකස් කර ගැනීමට ඩබ්ලියු. ඒ. සිල්වා දැක්වූ උනන්දුව, ''සිංහල මුද්‍රණ ශිල්පය පහසු කිරීමට නම්'' මැයෙන් 'තිලක' සඟරාවේ පළ වූ ලිපියෙන් පැහැදිලි වේ.

විසිවන සියවසේ දෙවන දශකයේ සිට 50 දශකය ආරම්භය පමණ වන තෙක් නිර්මාණකරණය හා පුවත්පත් සඟරා සංස්කරණය යන අංශවල කැපී පෙනුණු චරිතයක් වූ ඩබ්ලියු.ඒ. සිල්වාගේ මුද්‍රිත සන්නිවේදන භූමිකාව ශාස්ත්‍රඥයන්ගේ වැඩිදුර ගවේෂණයට ලක් විය යුතු අංශයකි. සිංහල පාඨක සමාජයේ අභිවෘද්ධිය උදෙසා ඔහු විසින් ලියා පළ කරන ලද ලිපි, කතු වැකි හා වෙනත් පුවත්පත් විශේෂාංග තෝරා පළ කිරීම සිංහල පුවත්පත් කලාව පමණක් නොව නූතන සිංහල සාහිත්‍යයේ ඉතිහාසය හා මතවාද හදාරන විද්‍යාර්ථීන්ට ද ප්‍රයෝජනවත් වන ශාස්ත්‍රීය කර්තව්‍යයක් වනු ඇත. ඩබ්ලියු. ඒ. සිල්වාගේ 125 වන ජන්ම සංවත්සරය යෙදෙන මේ වසරේ දී ඒ සඳහා ඩබ්ලියු. ඒ. සිල්වා පදනම අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමි.